# The Challenge

විවේකයට විනෝදයට මේ අභියෝගය විසඳන්න. A රූපය හා B රූපය බැලූ බැල්මට එක හා සමාන ය. නමුත් A රූපයේ නැති වැරදි 10 ක් B රූපයේ ඇත. හැකි නම් ඒ වැරදි 10 සොයාගන්න. B රූපය මත ඒ වැරදි රවුමකින් ලකුණු කරන්න. එසේ ලකුණු කළ B රූපය කපා අපට එවන්න. නිවැරදි විසඳුම් අතරින් තෝරා ගන්නා අයෙකුට **Sooriya Marketing Services** වෙතින් දුරකථන කාඩ්පත බැගින් හිමි වෙයි. අපේ ලිපිනය The Challenge Sannasa 22 Lorne Street Lalor Vic 3075

*මේ මාසයේ ජයග්‍රාහකයා*

සහන් කුමාරසිරි
Cranbourne

*පිළිතුරු එවූ අය අතරින්*

තිසුණ මාපා ඇට්වුඩ්
ජගත් මනතුංග ස්ට්‍රැත්මෝ
සන්ධ්‍යා සමරක්කොඩි හැම්ප්ටන් පාක්
මල්ලිකා නිමලරත්න ග්ලැඩ්ස්ටන් පාක්
හසිනි විමේෂා පෙරේරා ජයතුංග ඩැන්ඩිනොන්
හංසනී චතුභාෂණා පෙරේරා ජයතුංග ඩැන්ඩිනොන්
නිපුණ වීරසිංහ බෙරික්
අමිල් විජේසිංහ නරේවරන් සවුත්
වින්ධ්‍යා කුමාරතුංග ක්‍රැන්බර්න්
විජිත වික්‍රමසේකර හිල්සයිඩ්
අජිත් කුමාර පෙරේරා පැරමටා
විනුක අමරසේකර නෝත් මෙල්බන්
චන්දික සිරිකුමාර ප්‍රෙස්ටන්
කාන්චනා සූරියකුමාර ඩැන්ඩිනොන්
අසිත් මුණසිංහ ක්‍රෙගිබර්න්
විනාලි ද සිල්වා පෙන්රිත්

පසුගිය මාසයේ විසඳුම



*සිතුවම - සුනිල් කුමාර අමරකෝන්*

A



B



නම ..............................................................................

ලිපිනය (ඉංග්‍රීසියෙන් ලියන්න).........................................................

.............................................................................................

33 වන පිටෙන්

දශකයේ මුල් භාගයේ ඉහල සමාජයේ ගැවසුන මොහුගේ වදන් එකල ලාංකික සමාජයේ පැවතුන තත්වය පැහැදිලි කරන්නේ යයි සිතන බැවින් එම වදන් ඔබටද පැවසීමට අවසර දෙන්න. ඔහු පවසා සිටියේ කිසිම උසස් අධ්‍යාපනයක් නොලත් රෝයල් ආදි පාසල්වල ආදි ශිෂ්‍යයන් තමා උගත් පාසල තම සමාජ මට්ටම පෙන්වන ආභරණයක් ලෙස පෙන්වන අතර, ඔහුට ඔහුගේ තනතුර තෙලිප්’ජ්විල මධ්‍ය මහා විද්‍යාලයට ආභරණයක් කරදීමට සිදුව ඇති බවයි. තවත් මගේ මිතුරකුට අනුව වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලයේ අධ්‍යාපනය ලබා පසුව රෝයල් විද්‍යාලයේ අධ්‍යාපනය අවසන් කල ඔහුගේ ඥාති සොයුරෙකු මනමාලියක් බැලීමට යාමට පෙර මගේ මිතුරාට පවසා ඇත්තේ ඔහු වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලයේ අධ්‍යාපනය ලද බව මනමාලියට නොපවසන ලෙසයි.

**මේ හීනමානී හැඟීම් දෙස උපහාසයෙන් බලා ඇත්ත ඇති සැටියෙන් පැවසීමට බිය නොවුන තෙලිප්’ජ්විල මධ්‍ය මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වූ අපගෙන් වියෝවී ගිය මහාචාර්ය අලවත්තාගොඩ ප්‍රේමදාස මහතා වරක් රූපවාහිණියේ පෙනීසිට පවසා සිටියේ තමා දුප්පත් අඳ ගොවියකු ගේ දරුවකු බවත් කොළඹ ඉංග්‍රීසි කථා කරන ඉංග්‍රීසියන් අධ්‍යාපණය ලත් දරුවන් සමග ඉංග්‍රීසි භාෂාවෙන් තරඟ කර ඔවුනට වඩා ඉහලින් උසස් පෙල සමත් වුවත් ඉංග්‍රීසි කථාව නුහුරු බව පවසා එකල පැවති වෛද්‍ය විද්‍යාලයට තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ඔහුව අසමත් කළ බවයි.**

මේ සමාජ මට්ටම හී වෙනස් කම් ඔස්ටේලියානු සමාජයට අදාල නොවෙතත්, එ’වා මෙහි පැලපදියම් කරලීමට වලිකන පිරිසක්ද ඇති බව රහසක් නොවේ. ඔවුනට එය ඉටු කරගත හැක්කේ ලාංකික සමාජ කණ්ඩායම් තුල පමනක් හෙයින් ඔවුනද ඊනියා සංගම් තුල අරක් ගනී.

මේ සියල්ල තුළ තමන් සියලු ආර්ථික සැප සම්පතින් අනූන වුවද කිසියම් මානසික සංතෘප්තියක අඩුවකින් පෙලෙන සමහර සමාජමය කොටස්, දියුණු ධනවාදී සමාජයකදී ලබාගත නොහැකි එහෙත් තම මවු බිමේදී අත් දුටුව හැකි සමාජ පන්ති තලයක ලක්ෂණ විදහා පෑමට උත්සාහ කරනු දැකිය හැක. පුදුමයකට මෙන් මෙසේ අරඅඳින බොහෝ දෙනෙක් එවන් උසස් යයි සම්මත සමාජ පසුබිමක් මවු බිමේදී ලබා උපන් අය නොවන බව පැහැදිලිය. ලංකාවේදී කිසි දිනක තම පවුලේ අනෙක් සමාජිකයන් සමග හෝ අඩුම වශයෙන් තමා උගත් පාසලේදී සහෝදර සිසු සිසුවියන් සමග සන්නිවේදනය සඳහා භාවිතා නොකල ඉංග්‍රීසි භාෂාව කැඩි කැඩී හෝ සමාන්‍ය ජීවිතයේ සිංහළයන් ඉදිරිපිටදී භාවිතා කරනුයේ ඇයි දැයි මොහොතකට සිතන්න. යටත් විජිත මානසිකත්වයකින් පිඩිත වූ ලාංකික සමාජය තුල වරප්‍රසාධ ලත් සමාජ පංතිය තම සමාජ උඩඟුකම විදහා දැක්වීමේ දර්ශකය කරගත් ඉංග්‍රීසි භාෂාව, ඔස්ට්‍රෙලියානු සමාජයේ සිංහළ අය පමණක් සිටින අවස්ථාවලදී භාවිතය තමා කිසියම් ඉහල පංතියකට අයත් බව විදහා දැක්වීමේ බොළඳ ප්‍රයත්නයක් දැයි ඔබට නොසිතේද ? පුදමයකට මෙන් මෙසේ හැසිරෙනුයේ ඉංග්‍රීසි භාෂා භාවිතය පිලිබඳ උසස් පරිචයෙන් යුත් පුද්ගලයන්ට වඩා ගම්බද උපන් සිංහළ දෙමව්පියන් ගේ සිංහළ මාධ්‍යයෙන් අධ්‍යාපණය ලද දරුවෝය.

සමාජ ජීවිතයේ කිසිදිනක ටෙනිස් බෝලයකින් වත් ක්‍රිකට් නොගැසූ උදවිය ක්‍රිකට් ක්‍රීඩාව උපන්දා සිට කල එකම ක්‍රීඩාව මෙන් ප්‍රදර්ශණය කරමින් එය වෙනුවෙන් සැදී පැහැදී සිටින අයුරුද හාස්‍යජනකය. ක්‍රිකට් ක්‍රීඩාව ශ්‍රී ලාංකික ඉහල පන්තියට පමණක් උරුම වූ සමයක හැදී වැඩුන උදවියගේ මේ හැසිරීම හීනමාණය හැර වෙන කුමක්ද ! මෙවැනි මිතුරන්, දැන හඳුනන්නන් පාඨක ඔබටද නැත්නම් පුදුමයකි.

■

## Our Dance Teacher From Sri Lanka

Before my sister, my brother and I had started Sinhala dancing we didn't know what to expect and we didn't really want to learn. But now it is different and we like dancing so much nothing will make us stop.

Firstly I would like to thank our parents who explained the value of Sinhala cultural dancing.

Our dance teacher is Dinesh Apasinghe, who is kind, honest and very talented. He is a determined person who loves to teach Sinhala dancing to us. As I told you before we didn't want to lean dancing but as we continued our love for dancing developed and we will continue it for a very long time, mostly because our dance teacher is responsible and is willing to help us achieve as high as we can. We admire Dinesh Mama when he corrects older brothers and sisters who has had more experience in dancing. He helps them achieve the correct method of dancing so they can help younger people learn just the way he taught the older brothers and sisters.

Even though some students find it hard to remember all the wannam and the songs, Dinesh mama still helps us over and over and over again with such a kind manner.

My brother, sister and I all love to go to sinhala dancing every weekend. My brother keeps saying the wannam and practising all the time, even if we are walking to school he will rendomly sing the wannam happily to himself. It is funny but I take it as a sing of joy.

We are very lucky to have a dance teacher so talented.

At the same time we want to thank all the religious leaders who help us to learn religion.

We would also like to thank Tikiri magazine director Vineetha Wijerathna nanda for introducing such a good humble teacher and we thank all the other dance teachers in Australia.

They are all helping the young Sri Lankan children to find out more about their wonderful culture. We thank all the Sinhala Language Teachers too, for giving us knowledge about our loving Sri Lankan Society where we work together as a team whether we are young or small. We'd love to thank all those other who have done small things that have made a huge difference. Those little things that normal people can do to help a lot of others is very generous.

People like this have hepled keep part of Sri Lanka in Australia.

To all tha parents, thank you for showing us the correct ways to cultivate our customs with their kind hearts and thoughts.

And finally, we would like to thank and wish our Dance Teacher Dinesh Mama, we wish him good luck ato accomplish his goals and achievements for his wonderful future.

Sandamalie Wijetunga
Ruwanthi Wijetunga
Dineth Wijetnga